*සැ. යු.*-2010.02.05 දින පළ කරන ලද 1,640 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,641 - 2010 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා - 2010.02.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 764 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | -- |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 පෙබරවාරි මස 19 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 පෙබරවාරි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# පළාත් සභා නිවේදන

## දකුණු පළාත් සභාව

දකුණු පළාතේ 2007 අංක 05 දරන මුදල් (පරිපූරක විධිවිධාන) (සංශෝධන) ප්‍රඥප්තිය

දකුණු පළාතේ, ප්‍රධාන අමාත්‍ය සහ මුදල් අමාත්‍ය ගුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මම, දකුණු පළාත් සභාවේ 2007 අංක 05 දරන මුදල් (පරිපූරක විධිවිධාන) (සංශෝධන) ප්‍රඥප්තිය. දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලද 2008.12.22 දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් දැනුම් දෙමි.

ගුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් අමාත්‍ය.

2009 දෙසැම්බර් මස 21 වැනි දින,
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
ගාල්ලේ දී ය.

**දකුණු පළාත් සභාවේ 2007 අංක 05 දරන මුදල් (පරිපූරක විධිවිධාන) (සංශෝධන) ප්‍රඥප්තිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

1. මෙම ප්‍රඥප්තිය දකුණු පළාත් සභාවේ 2007 අංක 05 දරන මුදල් (පරිපූරක විධිවිධාන) (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද දින සිට ක්‍රියාත්මක විය යුතුය.

දකුණු පළාත් සභාවේ 1994 අංක 02 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ 1 වන ඡේදය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන දකුණු පළාත් සභාවේ 1994 අංක 02 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ පළමුවන ඡේදයේ 7 වන අංකයට ඉක්බිතිව 8 යනුවෙන් අංක කර ඊට "තුරඟ තරඟ ආඥාපනත" යන්න ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6(අ) වන අළුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තිය වන 6(අ) වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය.

ඉඩම් හා ගොඩනැගිලි බද්ද.

6(අ) (1) අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියමයන් මගින් එකී නියමයෙහි සඳහන් කරනු ලබන අනු ප්‍රමාණයන්ට අනුව හා පාර්ලිමේන්තුව විසින් පනවා ඇති නීතිවලින් අවසර දී ඇති අනු ප්‍රමාණයන්ට අනුව පළාත ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් වෙනුවෙන් පවත්නා ප්‍රාග්ධන අගය අනුව බද්දක් පැනවීම හා අය කර ගැනීම කළ හැකිය.

(2) (1) වන උප වගන්තියෙහි "ඉඩම" යන්නට රජයට අයිති යම් ඉඩමක්ද, "ගොඩනැගිල්ල" යන්නට රජයට අයිති යම් ගොඩනැගිල්ලක් ද ඇතුළත් වේ.

(3) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබිය යුතු අතර, මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයන් එම අනුමැතියේ දිනයේ සිට පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

(4) මෙම වගන්තියෙහි කාර්ය සඳහා "ප්‍රාග්ධන අගය" යන්න යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, එකී ගොඩනැගිල්ලට කරන ලද හෝ සවි කරන ලද වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් සහ සවි කිරීම් එකී ගොඩනැගිල්ල පිහිටා තිබෙන ඉඩමේ මිළ ද ඇතුළුව එකී ගොඩනැගිල්ල ඉදි කිරීමට වැය වූ වියදම ද, යම් හිස් ඉඩමක් සම්බන්ධයෙන් වන විට පසුගිය වර්ෂයෙහි දෙසැම්බර් මස 31 වැනි දිනට එකී ඉඩමෙහි වෙළඳ අගය ද ඉන් අදහස් වේ.

(5) මෙම වගන්තියෙහි ඇතුළත් විධිවිධාන අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියට නව VII පරිච්ඡේදය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන පරිච්ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන අළුත් පරිච්ඡේදය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය ලෙස බල පැවැත්විය යුතුය.

VII *වන පරිච්ඡේදය*

*ඔට්ටු ඇල්ලීම වෙනුවෙන් බද්ද*

ඔට්ටු ඇල්ලීම වෙනුවෙන් බද්ද.

13 (1) පළාත් ඇතුළත වූ ස්ථානයකදී හෝ පරිශ්‍රයකදී හෝ (පළාත තුළ හෝ ඉන් පිටත පැවැත්වෙන) යම් තුරඟ තරඟයකදී මුදලට හෝ ණයට තබන ලද හෝ පිළිගනු ලැබූ සෑම ඔට්ටුවකින්ම (මෙහි මින් මතු "ඔට්ටු බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක් අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියෝග මගින් නියම කරනු ලබන අනු ප්‍රමාණ අනුව පනවා අය කර ගත යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරනු ලැබූ යම් නියමයන් ඒ අනුමැතියේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

(3) මෙම වගන්තිය යටතේ වූ "ඔට්ටු බද්ද" ඔට්ටුවක් තැබූ විගසින්ම අය විය යුතු වන අතර එවැනි ඔට්ටු බද්දක් ගෙවීමට යටත් වන තැනැත්තෙක් එක් එක් ලිත් මාසය සඳහා ගෙවිය යුතු ඔට්ටු බදුවල ඓක්‍යය, එකී ලිත් මාසය ගෙවී දින දහයක් ඇතුළතදී දකුණු පළාතේ පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය.

(4) ඔට්ටු බද්දක් ගෙවීමට යටත්වන යම් තැනැත්තෙක් (3) වන උප වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි නියමිත දින දී හෝ ඊට පෙර එම බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක එම තැනැත්තා පැහැර හරින්නෙක් ලෙස සැලකිය යුතුය.

(5) යම් ඔට්ටු බද්දක් ගෙවීම පැහැර හැර ඇති විට, පැහැර හරින්නා විසින් ගෙවීම් පැහැර හැර ඇති මුදලෙන් සියයට දහයකට සමාන මුදලක් ද, ඉන්පසුව එළඹෙන සෑම මාසයක් සඳහා ම සියයට පනහක උපරිමයකට යටත් වූ සියයට දෙකක අමතර මුදලක් ද දඩ වශයෙන් ගෙවිය යුතුය.

(6) (5) වන උප වගන්තියෙහි සඳහන් දණ්ඩනයක් ද ඇතුළුව යම් ඔට්ටු බද්දක් ගෙවීම පැහැර ඇති විට, එය පළාත් සභාවට අයවිය යුතු ණයක් ලෙස සලකා පැහැර හරින්නාගෙන් අයකර ගත හැකිය.

(7) මේ වගන්තියෙහි සඳහන් යම් ව්‍යාපාරයක් නීතියෙන් තහනම් කරනු ලැබූ ව්‍යාපාරයක් වන්නේ නම්, මේ වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන කිසිවකින් ඒ ව්‍යාපාරයට නීත්‍යානුකූලභාවය ප්‍රදානය කෙරෙන ලෙස ඒ විධිවිධාන තේරුම් නොගත යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය නැවත අංක කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය එහි VIII වන පරිච්ඡේදය ලෙස නැවත අංක කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13, 14 සහ 15 වන වගන්ති නැවත අංක කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන, 14 වන සහ 15 වන වගන්ති පිළිවෙලින් 14 වන වගන්තිය, 15 වන වගන්තිය හා 16 වන වගන්තිය යනුවෙන් යළි අංක කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවයක් ඇති විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

02-256

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.